**#mediaethicsSL #EnglishPress #lka #theSundayTimes #December2**

නිරවද්‍යතාවයෙන් හීන වූ තොරතුරු පුවත්පත් තුළින් ඉදිරිපත් වීම සිතා මතාම නොමඟ යැවීමේ අදහසින් මෙන්ම, නොසිතා සිදුවන දෝෂයන් ලෙසින්ද විය හැකි බව නොකිවමනායි. ඒ කෙසේ වුවත් නිරවද්‍යතාවයෙන් තොර වාර්තා, ලිපි ඉදිරිපත් කිරීම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් ලෙසින් සැලකෙන අතරම, වාර්තාවල නිරවද්‍යතාව එය පළ කැරෙන්නට කලින් සොයා බැලීම සඳහා කර්තෘවරුන් හා ඒ ඒ පුවත්පත් කලාවේදීන් සෑම සාධාරණ ප්‍රයත්නයක්ම දැරිය යුත්තෝය යනුවෙන් මාධ්‍ය වෘත්තිය ප්‍රතිපත්ති සංග්‍රහයේ දැක්වේ.

ද සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පළ වී ඇති පහත ලිපිය උදාහරණයක් ලෙසින් ගනිමු. එම ලිපියට පාදක වී ඇති යෝජනාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවේ 48 (2) වගන්තිය ලෙසින් සඳහන් කරමින් යම් වගන්තියක් උපුටා දක්වා ඇත. කෙසේ නමුත් පහත පෙන්වා දී ඇති පරිදි සැබවින්ම ලිපියේ උපුටා දක්වා ඇත්තේ ව්‍යවස්ථාවේ 47 (2) වගන්තියයි. නමුත් ලිපිය පාදක කොටගෙන ඇති යෝජනාවේද උපුටා දක්වා ඇත්තේද ව්‍යවස්ථාවේ 48 (2) වගන්තිය වේ.

මෙය බොහෝ දුරට ලිපිය සඳහා කරුණු සොයාබැලීමේදී සිදුවූ මිනිස් දෝෂයක් විය හැකියි. නමුත් මෙය නිවැරදි කළ යුතු දෝෂයක් වන අතර, එම දෝෂය සමස්ත ලිපියේ අන්තර්ගතය වෙතම බලපෑම් එල්ල කරයි. ද සන්ඩේ ටයිම්ස් ඔන්ලයින් සංස්කරණයේ අදාළ ලිපියේ මෙම වැරැද්ද යම්තාක් දුරකට නිවැරදි කිරීමට සංස්කාරකවරුන් යත්න දරා තිබිණි. මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?